2016 . 07 . 11

REFERENCE ONLY

# මීගමුව අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම - 2016

**ඉතිහාසය** **8 ශ්‍රේණිය**

විභාග අංකය :...................................................... කාලය පැය 02 යි

### I කොටස

* මෙම කොටසේ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

* නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

(1). සියවස් තුනක් යන තුරු බාහිර ජාතියට යටත් නොවී තම ස්වාධීනත්වය රැකගත් රාජධානිය කුමක් ද?
(i) අනුරාධපුර (ii) පොළොන්නරුව (iii) කෝට්ටේ (iv) මහනුවර

(2). උඩරට රාජධානියේ නායක්කාර් වංශික අවසන් රජු වනුයේ,
(i) ශ්‍රී වික්‍රම රාජසිංහ ය. (ii) රාජාධි රාජසිංහ ය.
(iii) කීර්ති ශ්‍රී රාජසිංහ ය. (iv) ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍ර සිංහ ය.

(3). පාලන පහසුව සඳහා උඩරට රාජධානිය බෙදා තිබූ කොට්ඨාස ගණන කීය ද?
(i) 9 කි. (ii) 12 කි. (iii) 21 කි. (iv) 22 කි.

(4). ක්‍රි.ව. 1591 දී I වන විමලධර්මසූරිය නමින් රජ වූයේ,
(i) වීර සුන්දර බණ්ඩාර ය. (ii) යමසිංහ බණ්ඩාර ය.
(iii) ජයවීර බණ්ඩාර ය. (iv) කොනප්පු බණ්ඩාර ය.

(5). මුල්ලේරියා සටනේදී පෘතුගීසි හමුදා මෙහෙයවා පරාජයට පත් වූයේ,
(i) අපොන්සු පෙරෙයිරාද ලසාර්දා ය. (ii) ජෙරනිමෝද අසවේදූ ය.
(iii) පේරෝ ලෝපෙස්ද සූසා ය. (iv) කොන්ස්තන්තීනුදසා ය.

(6). උඩරට රාජධානියේ ක්‍රියාත්මක වූ බද්දේ කාර්යාංශය මගින් අලි ඇතුන්ගෙන් අය කළ බද්ද හඳුන්වන්නේ,
(i) මඩිගෙ බද්ද නමිනි. (ii) බඩහැල බද්ද නමිනි.
(iii) කුරුවෙ බද්ද නමිනි. (iv) ගැල් බද්ද නමිනි.

(7). උඩරට රාජධානි සමයේ නිලය අනුව රජුට පමණක් බලයෙන් දෙවැනි වූයේ,
(i) මහදිසාවෙ වරයා ය. (ii) අධිකාරම්වරයා ය.
(iii) රටේ රාළ ය. (iv) කෝරාළ ය.

(8). A වලින් දක්වා ඇති රජවරු රජවීමට පෙර හැදින්වූ නාමය B වලින් දක්වේ. A හා B තීරු නිවැරදිව ගැළපූ විට පිළිතුර කුමක් ද?

| A | B |
|---|---|
| 1. I රාජසිංහ | A - කන්නසාමි |
| 2. ශ්‍රී වික්‍රම රාජසිංහ | B - මහා අස්ථාන |
| 3. II රාජසිංහ | C - ටිකිරි කුමරු |

(i) ACB (ii) BCA (iii) CBA (iv) CAB

(9). පෘතුගීසි පෙරදිග පාලන මධ්‍යස්ථානය දක්වෙන පිළිතුර කුමක් ද ?

(i) ගෝව (ii) බතාවිය (iii) පොන්ඩිචේරි (iv) කල්කටා

(10). A - වස්කෝ ද ගාමා ඉන්දියාවට පැමිණීම.
B - ලොරෙන්සෝ ද අල්මේදා ලංකාවට පැමිණීම.
C - බර්තොලමියු ඩයස් අප්‍රිකාවේ සුභ පැත්මේ තුඩුවට පැමිණීම.
ඉහත සිදුවීම් අනුපිළිවෙළට පෙළගැස්වූ විට පිළිතුර වනුයේ,

(i) CBA ය (ii) CAB ය (iii) ACB ය (iv) BAC ය

(11) විජයබා කොල්ලයෙන් ජීවිතය අහිමි වූ රජතුමා වනුයේ,

(i). VII බුවනෙකබා රජු ය. (ii) මායාදුන්නේ රජු ය.
(iii). VI විජයබාහු රජු ය. (iv) 8 වන වීර පරාක්‍රමබාහු රජු ය.

(12) ක්‍රි.ව. 1505 පෘතුගිසින් ලංකාවට ගොඩ බසින විට යාපන රාජ්‍යය පාලනය කළ පාලකයා වනුයේ,

(i) සංකිලි රජතුමා ය. (ii) වේගරාජ සේකරම් ය.
(iii) හෙන්දර මානසිංහම් ය. (iv) පරරාජ සේකරම් ය.

(13). මහනුවර දළදා මැඳුර තැනවීමේ ගෞරවය හිමිවන රජතුමාගේ නම කුමක් ද?

(i) I වන විමලධර්මසූරිය (ii) II වන විමලධර්මසූරිය
(iii) II රාජසිංහ (iv) සේනාසම්මත වික්‍රමබාහු

(14). "අ" තීරයේ රජවරුන් විසින් පරාජය කළ පෘතුගීසි විරෝධී සටන් "ආ" තීරුවේ දක්වේ. 'අ' හා 'ආ' නිවැරදිව ගැළපූවිට පිළිතුර වන්නේ,

| " අ " | " ආ " |
|---|---|
| 1. ටිකිරි කුමරු | A - ගන්නෝරුව |
| 2. I විමලධර්මසූරිය | B - මුල්ලේරියාව |
| 3. II රාජසිංහ | C - දන්තුරේ |

(i) ACB ය (ii) CBA ය (iii) BCA ය (iv) BAC ය

(15). පුනරුදය ඇති වීමට බලපෑ ආසන්නතම හේතුව වූයේ,

(i) මුද්‍රණ යන්ත්‍රය නිපදවීම ය.
(ii) වෙළදාමේ දියුණුව ය.
(iii) කොන්ස්තන්තිනෝපල් නගරය තුර්කීන් අල්ලා ගැනීම ය.
(iv) විශ්ව විද්‍යාල බිහිවීම ය.

(16). පුනරුද සමයේ කලා නිර්මාණ ලෞකික මුහුණුවරක් ගනු ලැබීය. "ඇතැන්ස් හි පාසල" නිර්මාණ කළ ශිල්පියා වන්නේ,

(i) රෆායල් සැන්ඩි ය. (ii) ඩාවින්චි ය.
(iii) මයිකල් ආන්ජලෝ ය. (iv) බොට්ටි ෂෙල්ලි ය.

(17). A - කොපර්නිකස් සූර්ය කේන්ද්‍රවාදය ඉදිරිපත් කළේය.

B - ග්‍රහලෝක සූර්යයා වටා ඉලිප්සාකාරව ගමන් කරන බව ජොහැන්නස් කෙප්ලර් අනාවරණය කළේය.

ඉහත ප්‍රකාශ අතුරින්

(i) A පමණක් නිවැරදි ය. (ii) B පමණක් නිවැරදි ය.

(iii) A හා B දෙකම නිවැරදි ය. (iv) A හා B දෙකම වැරදි ය.

(18). පුනරුද අවධියේ නැගී සිටි බලවත් ජාතික රාජ්‍ය ඇතුළත් පිළිතුර වනුයේ,

(i) ජර්මනිය , ඉතාලිය , ප්‍රංශය ය. (ii) පෘතුගාලය , ඉතාලිය , ප්‍රංශය ය.

(iii) එංගලන්තය , ඕලන්දය, ඉතාලිය ය. (iv) ස්පාඤ්ඤය , ප්‍රංශය , එංගලන්තය ය.

(19). දේශගවේෂණ කටයුතු සඳහා අනුග්‍රහ දක්වූ පෘතුගීසි නායකයෙකි.

(i) නාවික හෙන්රි (ii) ඉසබෙලා රැජින

(iii) ෆර්ඩිනැන්ඩ් රජු (iv) VII හෙන්රි රජු

(20). පුනරුද සමය පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(i) දේව ධර්මය ඉගැන්වීමට මුල් තැනක් ලැබුණි.

(ii) තමා හා අවට පරිසරය පිළිබඳ විචාරශීලිව බැලීමට පෙළඹුනි.

(iii) පෘථිවි කේන්ද්‍රවාදය පිළිගැනුණි.

(iv) ගතානුගතික අදහස් වලින් යුක්ත විය.

## II කොටස

* මෙම කොටසේ පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.

* තවත් ප්‍රශ්න 4ක ට පිළිතුරු සපයන්න.

01. ඉතිහාසය විෂය යටතේ දෙවන වාරය තුළ කරන ලද ඇගයීම් ක්‍රියාවලිය ඇසුරෙන් පහත ප්‍රශන වලට පිළිතුරු සපයන්න.

(i) ඔබ ඇගයීම් සඳහා කරන ලද්දේ කුමන ක්‍රියාකාරකමක් ද ? (ලකුණු 02)

(ii) එම ඇගයීම් සඳහා යොදාගත් පාඩම් ඒකකය කුමක් ද ? (ලකුණු 02)

(iii) තොරතුරු ලබා ගැනීම සඳහා උපයෝගී කරගත් මූලාශ්‍ර දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(iv) ඔබට / ඔබ කණ්ඩායමට ලැබුණු මාතෘකාව ලියන්න. (ලකුණු 02)


(v) මෙම ක්‍රියාකාරකමේදී ඔබට / ඔබ කණ්ඩායමට ඇති වූ අභියෝග දෙකක් සහ ඒවා විසඳා ගැනීමට කරන යෝජනා 2 ක් ලියා දක්වන්න. (ලකුණු 04)

(vi) මෙවැනි ඉගෙනුම් ක්‍රියාකාරකම්වල දී ලඟා කරගත හැකි වාසි හතරක් ලියන්න. (ලකුණු 04)

02. (i) උඩරට රාජධානියේ A- ආරම්භක රජතුමා හා B-අවසාන රජතුමා නම් කරන්න. (ලකුණු 02)

(ii) උඩරට රාජධානියට තර්ජන එල්ල වූ සමකාලීන අනෙක් රාජ්‍යයන් දෙකක් ලියන්න. (ලකුණු 04)

(iii) මෙම රාජධානියේ ස්වාධීනත්වයට එහි ස්වභාවික පිහිටීම බලපෑ ආකාරය කෙටියෙන් ලියන්න. (ලකුණු 05)

03. 

මෙම චිත්‍රයෙන් දක්වෙන්නේ උඩරට පාලනය කළ කීර්තිමත් පාලකයෙකි. ඒ ඇසුරෙන් පිළිතුරු සපයන්න.

(i). A - මෙම රජතුමාගේ නම කුමක් ද?

B - මෙතුමා කුමන රාජ වංශිකයෙක් ද ? (ලකුණු 02)

(ii) 1. මෙම රජුගේ කාලයේ පහත රට ප්‍රදේශ වල සිටි බටහිර ජාතිය නම් කරන්න.
2. මෙම රජු හමුවීමට පැමිණි ඉංග්‍රීසි දූතයා කවුද ?
3. මෙම රජු විසින් සංඝරාජ තනතුරට පත්කළ හික්ෂුන් වහන්සේ කවුද ?
4. මෙම රජතුමා ලාබාල වියේ බලයට පැමිණි නිසා රාජ්‍ය පාලන කටයුතුවලට මැදිහත් වූ ඔහුගේ පියා කවරෙක් ද ? (ලකුණු 04)

(iii) හින්දු භක්තිකයෙකු වුවත් බෞද්ධාගමික දියුණුවට මෙම රජු ක්‍රියා කළ ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 05)

04. (i) ශ්‍රී ලංකාව යටත් කරගෙන සිටි,
A - ලන්දේසීන්ගේ B - ඉංග්‍රීසීන්ගේ මව් රටවල් ලියා දක්වන්න. (ලකුණු 02)

(ii) පෘතුගීසින් මුල් වරට ලංකාවට ගොඩ බසින විට අපරට තුළ පාලන මධ්‍යස්ථාන 3 ක් තිබුණි. ඉන් එකක් යාපන රාජ්‍යය වේ. අනෙක් රාජ්‍ය දෙක හා එකල එහි සිටි පාලකයින් දෙදෙනා ලියා දක්වන්න. (ලකුණු 04)

(iii) පෘතුගීසින්ට කෝට්ටේ රාජ්‍ය අත්පත් කර ගැනීමට උපකාරී වූ හේතු දෙකක් ලියා එකක් පැහැදිලි කරන්න. (ලකුණු 05)

05. (i) පුනරුද සමයේ ග්‍රීක රෝම ගෘහ නිර්මාණ ශිල්පය පිළිඹිබු වන අපූර්වත ම නිර්මාණ දෙකක් ලියන්න. (ලකුණු 02)

(ii) මධ්‍යකාලීන අවධියේ හා පුනරුද අවධියේ පැවති දේශපාලන ලක්ෂණ දෙක බැගින් වෙන් වෙන්ව ලියා දක්වන්න. (ලකුණු 04)

(iii) පුනරුදය ඇති වීමට බලපෑ හේතු දෙකක් ලියා ඉන් එකක් පැහැදිලි කරන්න. (ලකුණු 05)

06. (i) මහනුවර රාජධානි සමයේ රජුගේ උසාවිය "මහනඩුවයි" රජු විසින් අසනු ලැබූ නඩු වර්ග දෙකක් ලියන්න. (ලකුණු 02)

(ii) මහනුවර රාජධානියේ චිත්‍ර දැකිය හැකි ස්ථාන දෙකක් හා චිත්‍රවල විශේෂ ලක්ෂණ දෙකක් ලියන්න. (ලකුණු 04)

(iii) උඩරට රාජධානි සමයේ, සමාජයේ ස්වරූපය කෙටියෙන් පහදන්න. (ලකුණු 05)

07. පුනරුදයේ තවත් දියුණු වූ අංශයකි දේශ ගවේෂණය.
(i) A - බටහිර ඉන්දීය දූපත් සොයාගත් දේශ ගවේෂකයාද
B - ප්‍රථම වරට ලෝකය වටා යාත්‍රා කළ තැනැත්තා ද නම් කරන්න. (ලකුණු 02)

(ii) දේශගවේෂණය හා නව වෙළඳ මාර්ග සොයා ගැනීමට උපකාරී වූ විද්‍යාත්මක සොයා ගැනීම් හතරක් ලියන්න. (ලකුණු 04)

(iii) නව වෙළඳ මාර්ග සොයා යාමට බලපෑ හේතු දෙකක් ලියා ඉන් එකක් පැහැදිලි කරන්න. (ලකුණු 05)